# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ආරක්ෂක අමාත්‍යාංශය

**ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)**

**අරමුදල් සැපයීම : ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB)**

**ණය මුදල් අංක : L0124A**

**ක්‍රියාත්මක කිරීම : ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRI)**

# ඇබෑර්තු

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයෙහි (PMU) හා RLVMMP ක්ෂේත්‍රයේ පවත්නා පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින්, අයදුම්පත් කැඳවනු ලබන අතර, පත් කිරීම, අංක 02/2026 දරන MSD චක්‍රලේඛයෙහි කොන්දේසි මත පදනම්ව කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීමට නියමිතය.

**ප්‍රමාණ සමීක්ෂක (වර්ගීකරණය F)**

යටිතල පහසුකම් සංවර්ධනය හා ආශ්‍රිත ක්ෂේත්‍රය සඳහා පිරිවැය ඇස්තමේන්තු සමග ටෙන්ඩර් ලේඛන හා ප්‍රමාණපත්‍ර සකස් කිරීමට සහායවීම සමග විනිවිදභාවයෙන් හා තරගකාරී කොන්ත්‍රත් ප්‍රදානයට සහාය වීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ ලංසු හා සැපයුම්කරුවන්ගේ මිල ගණන් අගැයුම් කටයුතු සිදු කිරීම සම්බන්ධ පළපුරුද්ද තිබීම අපේක්ෂා කෙරේ. කොන්ත්‍රාත් නියමයන් සත්‍යාපිත ප්‍රමාණයන් හා තත්ත්ව ප්‍රමිතීන් හා සැසඳෙන පරිදි අන්තර්වාර හා අවසන් මුදල් ගෙවුම් සහතික පරීක්ෂා කිරීම සහ/හෝ සකස් කිරීම පිළිබඳ හැකියාව තිබිය යුතුය. නිර්මාණ වෙනස්වීම්, අනපේක්ෂිත පදනම් තත්ත්වයන් හෝ තාක්ෂණික අවශ්‍යතා හේතුවෙන් තක්සේරුකරණ හා අගැයුම් විචලනය සම්බන්ධ පළපුරුද්ද තිබිය යුතු අතර, සිවිල් වැඩ හා භාණ්ඩ කොන්ත්‍රාත් ඵලදායී ලෙස, ආර්ථිකමය ලෙස හා ව්‍යාපෘති අරමුණු සමග අනුකූලභාවයෙන් ඉටු කළ යුතුය.

අදාළ සුදුසුකම් හා පළපුරුද්ද අවශ්‍යතාවයන් අංක 02/2026 ඇමුණුම ප්‍රකාරව MSD චක්‍රලේඛයෙහි 02 වන තීරුව - x සහ xi පිටුව වර්ගකරණය "F" ට අදාළව වේ.

**පොදු කොන්දේසි**

1) පහත සඳහන් පරිදි, අයදුම්කරු, අදාළ භාර ගැනීමේ අවසන් දිනයේ හා අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය වන විට වයස අවුරුදු 64ට අඩු විය යුතුය.

2) සියලුම තෝරාගත් අයදුම්කරුවන් තම රාජකාරි, අදාළ රාජ්‍ය සංවිධාන හා අනෙකුත් නියෝජිතායතන සමග සහසබඳතාවයෙන් හා සම්බන්ධීකරණයෙන් යුක්තව සිදු කළ යුතුය.

3) විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල කාර්ය පළපුරුද්ද සහිතවීම අමතර සුදුසුකමක් වනු ඇත.

4) ඉහත තනතුරු සඳහා, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය, රජයේ රෙගුලාසි සම්බන්ධව හුරු පුරුදුතාවය හා පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය පූර්ව සුදුසුකම් වේ.

5) රජයේ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල, සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා ආයතනවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, අදාළ ප්‍රධානීන් විසින් මෙම අයදුම්කරු අදාළ තනතුරු තෝරා ගතහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණ සඳහන් කළ යුතුය.

**වැටුප්**

6) අංක 02/2026 දරන දෙපාර්තමේන්තු කළමනාකරණ සේවා චකුලේඛය හා එහි සංශෝධන (ඇතොත්) ප්‍රකාරව දීමනා සහිතව ගෙවනු ලැබේ. (එසේම, සේවක අර්ථසාධක අරමුදල සඳහා, සේවකයා විසින් තම මාසික වැටුපෙන් 8% දායකත්වයක් දැරිය යුතු අතර, සේව්‍යයා විසින් එයට 12% දායකත්වයක් දරනු ඇත. එයට අමතරව, සේව්‍යයා විසින් 3% දායකත්වයක් සේවක භාර අරමුදල වෙනද ලබාදෙනු ඇත.

**අයදුම්පත්**

7) සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින්, තමන්ගේ සුදුසුකම්/ යෝග්‍යභාවය ප්‍රදර්ශනය කරමින් වූ ආවරණ ලිපියක් සමග සියලු ජීවදත්ත, අදාළ අධ්‍යාපනික, වෘත්තීය හා පළපුරුද්ද සම්බන්ධ සහතිකවල සහතික කළ පිටපත් ඇතුළත්ව ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනකුගේ ඇමතුම් විස්තර සහිතව තම අයදුම්පත් යොමු කළ යුතුය. එසේ නොවන අයුරින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තෝරා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

8) එක් එක් තනතුරකට වෙන් වශයෙන් වූ අයදුම්පත් සමග තමන්ගේ ජීවදත්ත, අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනකුගේ ඇමතුම් විස්තර ඇතුළත්ව, ලියාපදිංචි තැපැලෙන්, පහත සඳහන් ලිපිනය වෙත, **2026.07.03** දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. කරුණාකර **අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය**.

**තැපැල් ලිපිනය : ව්‍යාපෘති අධ්‍යක්ෂ**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදනම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, අංක 99/1, ජාවත්ත පාර, කොළඹ 05. ඇමතුම් අංක 011-2559869

9) ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද සහිත කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, කුසලතා මත තේරීම් සිදු කරනු ඇත.

10) බඳවා ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධව යම් බලපෑම් සිදු කිරීම හෝ නියෝජනයන් සිදු කිරීම අදාළ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.

**ලේකම්,**

**ආරක්ෂක අමාත්‍යාංශය**